විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS
ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வூதியம்
Sri Lanka Pensions
පරපුරක අභිමානය
தலைமுறையொன்றின் பெருமிதம்
Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. } Pen/Pol/06/09-2023

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2026.03.10

**විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි : 01/2026**

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>විශ්‍රාමිකයින්ට භාණ්ඩාගාර 147 නිකුත් කිරීම</u>**

උක්ත කරුණට අදාළව 2018.05.24 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2018 හි (10) ඡේදයේ (IV) යටතේ සඳහන් කාරණය සහ 2015.04.24 දිනැතිව නිකුත් කර ඇති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2015 හි (09) ඡේදයේ (IV) යටතේ සඳහන් කාරණය පිළිබඳව ඔබේ කාරුණික අවධානය යොමු කරවමි.

02. "2015.04.02 දින සිට භාණ්ඩාගාර 147 විශ්‍රාමික හැඳුනුම්පත භාවිත නොකළ යුතු" බවට ඉහත (01) ඡේදයේ සඳහන් චක්‍රලේඛ මගින් උපදෙස් ලබා දී ඇත. එසේ වුව ද 2015.04.02 දිනට පෙර සේවයෙන් විශ්‍රාම ගොස් මාර්ගගත නොවන ක්‍රමවේදය ඔස්සේ විශ්‍රාම වැටුප සක්‍රීය කරන ලද විශ්‍රාමිකයින් වෙත නව විද්‍යුත් විශ්‍රාමික හැඳුනුම්පත නිකුත් කිරීමට දැනට හැකියාවක් නොමැති බැවින් පහත සඳහන් විශ්‍රාමිකයින් වෙත තවදුරටත් භාණ්ඩාගාර 147 විශ්‍රාමික හැඳුනුම්පත නිකුත් කිරීමට කටයුතු කළ යුතු ය.

i. 2015.04.02 දිනට පෙර සේවයෙන් විශ්‍රාම ගත්වා, මාර්ගගත නොවන ක්‍රමවේදය ඔස්සේ විශ්‍රාම වැටුප සක්‍රීය කරන ලද, මේ වන තෙක් විශ්‍රාම වැටුප් හැඳුනුම්පතක් නිකුත් කර නොමැති විශ්‍රාමිකයින්

ii. 2015.04.02 දිනට පෙර සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් පසුව නිකුත් කරන ලද භාණ්ඩාගාර 147 විශ්‍රාමික හැඳුනුම්පත අස්ථානගත වී ඇති විශ්‍රාමිකයින්



මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2121961, Fax: 2342078, Email: inquiries.pms@pensions.gov.lk, Web: www.pensions.gov.lk

iii. 2015.04.02 දිනට පෙර සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් පසුව නිකුත් කරන ලද භාණ්ඩාගාර 147 විශ්‍රාමික හැඳුනුම්පත තවදුරටත් භාවිත කළ නොහැකි තත්ත්වයට පත් වී ඇති විශ්‍රාමිකයින් (පළුදුවීම, තොරතුරු අපැහැදිලි වීම වැනි හේතු මත)

**චාමින්ද හෙට්ටිආරච්චි**

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

දුරකථනය : 011 2 421786

ෆැක්ස් : 011 2 431413

විද්‍යුත් ලිපිනය : pen7policydep@gmail.com

**පිටපත්:**

1. ජනාධිපති ලේකම් - කරු. දැ.ගැ.ස.
2. අග්‍රාමාත්‍ය ලේකම් - කරු. දැ.ගැ.ස.
3. ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
4. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
5. විගණකාධිපති - කරු. දැ.ගැ.ස.